Australian Government

COVID-19 VACCINATION

# ඔබගේ කෝවිඩ්-19 Comirnaty (Pfizer) එන්නතට පසුව

අවසාන යාවත්කාලීන කිරීම: 2021 අගෝස්තු 18

## එන්නත සම්බන්ධව

අද ඔබ හට කොමිර්නටි **(Comirnaty) (ෆයිසර් ඕස්ට්‍රේලියා පුද්ගලික සමාගම)** එන්නත ලබාදුණි.

මෙම එන්නත මගින් මිනිසුන් කෝවිඩ්-19 ආසාදනයවීමෙන් වළක්වා ගත හැකිය. Pfizer COVID-19 හි කිසිදු ජීවී වයිරසයක් අඩංගු නොවන අතර ඔබට කෝවිඩ්-19 ආසාදනය ඇතිකල නොහැක. එහි අඩංගු වන්නේ SARS-CoV-2 වයිරසයේ වැදගත් කොටසක් වන ස්පයික් ප්‍රෝටීන් (spike protein) ලෙස හඳුන්වන ජාන කේතයවේ. එන්නත ලබා ගැනීමෙන් පසුව, ඔබගේ ශරීරය මගින් ස්පයික් ප්‍රෝටීනයේ පිටපත් සකස් කරයි. ශරීරය මගින් ජාන කේතය වේගයෙන් බිඳ දමයි.

## Pfizer ලබා දීමෙන් පසු බලාපොරොත්තු විය හැකි දේ

ඕනෑම එන්නතක් මෙන්, කෝවිඩ්-19 එන්නත ලබාගත් පසු සමහර අතුරු ආබාධ ඇතිවිය හැකිය.

**Pfizer** ලබා ගැනීමෙන් පසු **බහුලව** ඇතිවිය හැකි අතුරු ආබාධ අතර පහත දේ ඇත:

- වේදනාව හෝ එන්නත ලබාදුන් ප්‍රදේශයේ ඉදිමුව
- වෙහෙසකරබව
- හිසරදය
- මාංශ පේශි රුදාව
- උණ සහ ශීතල බව
- හන්දිපත් රුදාව.

**Pfizer** ලබා ගැනීමෙන් පසු **අඩු වශයෙන්** ඇතිවිය හැකි අතුරු ආබාධ අතර පහත දේ ඇත:

- එන්නත ලබා දුන් ප්‍රදේශයේ රත්පැහැවීම
- ඔක්කාරය
- වසා ගැටිති විශාලවීම
- අසනීප ගතිය දැනීම
- අත්පාවල වේදනාව
- නින්ද නොයෑම
- එන්නත ලබා දුන් ප්‍රදේශය කැසීම.

මෙම අතුරු ආබාධ සාමාන්‍යයෙන් ඉතා අඩු වශයෙන් ඇතිවන අතර සාමාන්‍යයෙන් දිනකට හෝ දින දෙකකට පසුව නැතිවී යනු ඇත. වෙනත් එන්නත් සමඟ සැසඳීමේදී මෙම එන්නත සමහර අය අතර මගින් ෆ්ලූ ආකාරයේ වඩා සැලකිය යුතු ආකාරයේ රෝග ලක්‍ෂණ ඇතිවිය හැකි අතර සාමාන්‍ය රාජකාරිවලින් බැහැරව සිටීමට අවශ්‍ය විය හැකිය. මෙම රෝග ලක්‍ෂණ පළමුවන හෝ දෙවන මාත්‍රාවෙන් පසුව ඇතිවිය හැකි වුවද දෙවන මාත්‍රාවට පසුව වඩා බහුලවේ.

එන්නත ලබා ගැනීමෙන් පසු එන්නත ලබාදුන් ස්ථානයේ වේදනාව හෝ උණ, හිසරදය හෝ ඇඟපත වේදනා ඇතිනම්, පැරසිටමොල් හෝ අයිබියුප්‍රොෆීන් ලබාගත හැකිය. මේවා ලබා ගැනීම මගින් ඉහත රෝග ලක්‍ෂණවලින් සමහරක් අඩුකර ගැනීමට උපකාර විය හැකිය (එන්නත ලබා ගැනීමට පෙර පැරසිටමොල් හෝ අයිබියුප්‍රොෆීන් ලබා ගැනීම අවශ්‍ය නැත). එන්නත ලබාදුන් ප්‍රදේශයේ ඉදිමුවක් ඇතිනම්, ශීතල ඇතිව තද කරන දෙයක් (cold compress) භාවිතා කල හැකිය.

**කොමිර්නටි** ලබා ගැනීමෙන් පසුව **දුර්ලභ ලෙස ඇතිවිය හැකි** බවට වාර්තාවී ඇති අතුරු ආබාධ පහත ඒවාවේ:

- දරුණු අසාත්මිකතා ප්‍රතිචාර (ඇනෆිලැක්සිස්)
- මයෝකාඩයිටිස් (හෘද පේශියේ දාහය) සහ පෙරිකාර්ඩයිටිස්(හෘදයේ බාහිර ආස්ථරයේ දාහය) බොහෝ වාර්තා වී ඇති තත්වයන් ඉතා අඩු, තනියෙන් අවසන් වන, සහ වේගයෙන් සුව වන ඒවා වුවද, දිගු කාලීන පසු විපරම් දිගටම සිදු වෙමින් පවතී. වැඩිපුරම මෙම තත්වයන් වාර්තාවී ඇත්තේ දෙවන මාත්‍රාවෙන පසුව වන අතර, තරුණ පිරිමින් අතරය (වයස අවුරුදු 30 ට අඩු).

පහත අවස්ථාවල එන්නත ලබා ගැනීමෙන් පසු වෛද්‍ය අවධානය ලබා ගත යුතුවේ:

- ඔබට අසාත්මික ප්‍රතිචාරයක් ඇති බවට ඔබ සිතන අවස්ථාවල. ඔබට හුස්ම ගැනීමේ අපහසුව, ඇදුම ආකාරයේ වීසිත්, හද ගැස්ම වැඩිවීම හෝ කලාන්තවීම ආදී රෝග ලක්‍ෂණ ඇතිනම්, දුරකථන අංක 000 අමතන්න
- පපුවේ වේදනා, පීඩනය හෝ අපහසුතා, අක්‍රමවත් හෘද ස්පන්දනය, ස්පන්දනය අතර මඟ අඩුවීම හෝ හදවත සැලෙන බව, ක්ලාන්ත බව, හුස්ම කෙටිවීම හෝ හුස්ම ගැනීමේදී වේදනාව ඇතිවීම
- යම්කිසි අතුරු අබාධයක් ඇතිවිය හැකි බවට හෝ නව හෝ අනපේක්ෂිත රෝග ලක්‍ෂණ ඇති බවට කණස්සල්ලක් ඇති නම්
- අපේක්ෂිත අතුරු ආබාධයක් ඇතිවූ අතර එය දින කිහිපයකට පසුවද පහව ගියේ නැතිනම්.

හදිසි නොවන රෝග ලක්‍ෂණ සම්බන්ධයෙන් ඔබගේ සාමාන්‍ය සෞඛ්‍යය රැකවරණ සපයන්නා (පවුලේ වෛද්‍යවරයා) වෙත යා හැකිය.

## එන්නත්වල ආරක්‍ෂාකාරී බව නියාමනය කිරීම සහ අතුරු ආබාධ වාර්තා කිරීම

සැක සහිත අතුරු ආබාධ සම්බන්ධයෙන් ඔබගේ එන්නත් සපයන්නා හෝ වෙනත් සෞඛ්‍යය රැකවරණ වෘත්තීකයන් හට වාර්තා කල හැකිය. ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රාන්ත හෝ ටෙරිටරි සෞඛ්‍යය දෙපාර්තමේන්තුව වෙත හෝ කෙළින්ම ප්‍රතිකාරක භාණ්ඩ පරිපාලනය (Therapeutic Goods Administration (TGA)) වෙත හෝ විධිමත් වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත.

ඒ සම්බන්ධයෙන් ඔබ විසින්ම වාර්තාවක් ඉදිරිපත කිරීමට මනාප අවස්ථාවල, TGA වෙබ් අඩවියේ COVID-19 එන්නත හා සම්බන්ධ යයි සැක කරන අතුරු ආබාධ වාර්තා කිරීම සඳහා වෙබ් පිටුව වෙත පිවිස එහි ඇති උපදෙස් අනුගමනය කරන්න.

## එන්නතට පසු කෝවිඩ්-19 සම්බන්ධ පරීක්‍ෂා සිදු කිරීම

කෝවිඩ්-19 එන්නතෙහි සමහරක් අතුරු ආබාධ කෝවිඩ්-19 ආසාදනයේ රෝග ලක්‍ෂණ හා සමාන විය හැකිය (උදා. උණ). කෙසේවුවද, Pfizer හි කිසිදු ජීවී වයිරසයක් අඩංගු නොවන අතර ඔබට කෝවිඩ්-19 ආසාදනය ඇතිකල නොහැක. ඔබ විසින් පහත අවස්ථාවල කෝවිඩ්-19 පරීක්‍ෂණයක් කරවා ගැනීම හෝ හුදෙකලාවීම අවශ්‍ය නොවේ:

- එන්නත ලබා ගෙන පළමු දින දෙකෙහිදී උණ, හිසරදය හෝ වෙහෙසකර බව වැනි සාමාන්‍ය රෝග ලක්‍ෂණ ඇතිවීම, සහ

- කිසිදු ශ්වසන රෝග ලක්ෂණ (උදා: සොටු ගැලීම, කැස්ස, උගුරේ ආසාදන, ගඳ සුවඳ හෝ රස නොදැනීම) නොමැති බවට ඔබට විශ්වාස නම්.

කෙසේ වුවද, ඔබගේ ප්‍රාන්තයේ/ටෙරිටරියේ ඇති වඩාත්ම යාවත්කාලීන මාර්ගෝපදේශ පරීක්ෂා කල යුතුය. ඔබගේ ප්‍රදේශයේ කෝවිඩ්-19 පැතිරීමක් ඇතිනම්, මෙම උපදෙස් වෙනස් විය හැකිය. කෙසේ වුවද, ඔබ වෙනත් නිර්නායකයන් සපුරාලන්නේ නම්, උදා. ඔබ කෝවිඩ්-19 ආසාදිතයෙකු හා සමීපව සම්බන්ධවුණු අයෙකු නම්, ඔබ විසින් කෝවිඩ්-19 පරීක්ෂණයක් කර ගත යුතුය. සැකයක් ඇතිනම්, වෛද්‍ය උපදෙස් ලබා ගන්න.

## ඔබගේ දෙවෙනි හමුවීම අමතක නොකරන්න

Pfizer COVID-19 එන්නතින් මාත්‍රා දෙකක් ලබා ගැනීම වැදගත්වේ. මෙම මාත්‍රා සාමාන්‍යයෙන් සති 3 - 6 අතර කාල පරතරයක් ඇතිව ලබා දුන්නද, විශේෂ අවස්ථානුගත තත්වයන් යටතේ වඩා වැඩි කාල අන්තර නිර්දේශ කල හැකිය. දෙවන මාත්‍රාව මගින් කෝවිඩ්-19 ට එරෙහිව ඇති ආරක්ෂාව දීර්ඝ කිරීමට බොහෝ ඉඩකඩ ඇත.

## හමුවීමේදී ඔබ ලබා දෙන තොරතුරු උපයෝගී කර ගන්නා ආකාරය

ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කරන, තැන්පත් කර තබන සහ භාවිතා කරන ආකරය සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා https://www.health.gov.au/using-our-websites/privacy/privacy-notice-for-covid-19-vaccinations වෙබ් අඩවිය වෙත පිවිසෙන්න